හිමිකම් ඇවිරිණි / All Rights Reserved

ශ්‍රී/විශාඛා විද්‍යාලය කොළඹ - 05
Ca / Visakha Vidyalaya Colombo - 05

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2026
General Certificate of education (Adv. Level) Examination 2026

13 ශ්‍රේණිය - තෙවන වාර පරීක්ෂණය - 2026 ජුනි
Grade 13 - 3rd Term Test - June 2026

සාමාන්‍ය පොදු පරීක්ෂණය
**Common General Test**

**12** **S**

කාලය : පැය 2 යි
Time : 2 hours

Name / නම / විභාග අංකය :- ..............................................................................

උපදෙස් : - සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- **ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.**
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ මබේ විභාග අංකය ලියන්න.
- උත්තර පත්‍රයේ පිටුපස ඇති අනෙක් උපදෙස් සැලකිලිමත්ව කියවා **පිළිපදින්න.**
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත්ම** ගැළපෙන පිළිතුර තෝරාගෙන, එය උත්තර පත්‍රයේ **පිටුපස** දැක්වෙන උපදෙස් පරිදි (X) යොදා දක්වන්න.

1. කෘත්‍රිම බුද්ධියේ නිර්මාතෘවරයා වන්නේ මින් කවුරුන් ද?
   (1) චාල්ස් බැබේජ්.
   (2) රෝන් මැකාර්ති.
   (3) මාර්ක් සකර්බර්ග්.
   (4) එල්හු කැටස්.
   (5) විලියම් තෝමස් බෝන්

2. Booking.com වෙබ් අඩවිය නම කළ 2025 වසරේ ලොව ඉහළම ආයන්තුක පත්කාරයක් සහිත නගරය කුමක් ද?
   (1) නවදිල්ලිය
   (2) ලන්ඩන්
   (3) මොස්කව්
   (4) මහනුවර
   (5) සීගිරිය

3. ලෝක රාජ්‍යනායක සමුළුව 2025 වසරේදි පවත්වනු ලැබූ රට කුමක් ද?
   (1) එක්සත් අරාබි එමිර් රාජ්‍යය
   (2) ඇමරිකා එක්සත් ජනපදය
   (3) ප්‍රංශය
   (4) චීනය
   (5) දකුණු කොරියාව

4. ජිනීවා නුවර පැවති 2025 ලෝක බුද්ධිමය දේපළ ගෝලීය සම්මාන උළෙලේ දී ''පරිසර'' කාණ්ඩය යටතේ ප්‍රථම ස්ථානය දිනාගත් ශ්‍රී ලාංකික පර්යේෂිකාව කවුරුන් ද?
   (1) ආචාර්ය හදීෂා චන්ද්‍රසේන
   (2) මහාචාර්ය මාලනී ඇඳගම
   (3) ආචාර්ය කාමලිකා අබේරත්න
   (4) මහාචාර්ය හිරුණිකා හිඹුරේගම
   (5) මහාචාර්ය සුජාතා සමරකෝන්

5. උතුරු පොල් ත්‍රිකෝණයට අයත් දිස්ත්‍රික්ක මොනවා ද?
   (1) කුරුණෑගල, පුත්තලම, අම්පාර
   (2) වව්නියාව, අම්පාර, පොළොන්නරුව
   (3) යාපනය, මුලතිව්, මන්නාරම
   (4) යාපනය, කුරුණෑගල, පුත්තලම
   (5) කුරුණෑගල, හලාවත, වව්නියාව

6. ලෝක බැංකුව විසින් 2026 ජුනි 30 දක්වා කාලය සඳහා වන ආදායම් මට්ටම අනුව රටවල් වර්ගීකරණ වාර්තාවට අනුව ශ්‍රී ලංකාව හැඳින්වෙන්නේ කුමන මට්ටමේ ආදායම් ලබන රටක් ලෙස ද?
   (1) අන්ත පහළ ආදායම් ලබන රටක් ලෙස ය.
   (2) ඉහළ මැදි ආදායම් ලබන රටක් ලෙස ය.
   (3) ඉහළ පුරිපි ආදායම් ලබන රටක් ලෙස ය.
   (4) උඟත ධරිද්‍රතා සහිත රටක් ලෙස ය.
   (5) පහළ මැදි ආදායම් ලබන රටක් ලෙස ය.

7. ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයින්ගේ සංගමය විසින් සංවිධානය කරනු ලැබූ ස්වර්ණ පුස්තක සම්මාන උලෙළේ දී 2025 වසරේ ස්වර්ණ පුස්තක සම්මානය හිමි වූ කෘතිය කුමක් ද?
   (1) මහාචාර්ය සුනන්ද මහේන්ද්‍රයන්ගේ තිරුවක් දෙවිවරු නවකථාව
   (2) කේ. ජයතිලකයන්ගේ චරිත තුනක් නවකථාව
   (3) සයිමන් නවගත්තේගමයන්ගේ දඩයක්කාරයා නවකථාව
   (4) ප්‍රවීණ ලේඛක චන්ද්‍රරත්න බණ්ඩාර විසින් රචිත පියාසර සමය නවකථාව
   (5) ප්‍රසාද් මස්ඉඹුල රචිත මැයිමාර ප්‍රසංගය නවකථාව

8. 2026 ලෝක විවාහක රූ රැජින තරගාවලියේ දී තෙවන ස්ථානය දිනාගත් ශ්‍රී ලාංකික රූ රැජින කවුද?
   (1) සබිනා යුගල් මහත්මිය
   (2) අම්කා සර්පිනා
   (3) මලාලා යූසුෆ්
   (4) අනුදි ගුණසේකර
   (5) කැස්රිනා වැලන්ටයින්

9. 2026 වසරේ දකුණු ආසියාවෙන් වාර්තා වූ වවුලන් හා පලතුරු මගින් බෝවන ඉහළ මරණ අනුපාතයක් සහිත වෛරසය කුමක් ද?
   (1) සනීයර් වෛරසය
   (2) ඉන්ෆ්ලුවෙන්සා වෛරසය
   (3) නිපා වෛරසය
   (4) චිකන් ගොක්ස් වෛරසය
   (5) වෙරෆින් වෛරසය

10. ප්‍රථම වතාවට කාන්තාවන්ට ඡන්ද අයිතිය ලබාදුන් රට කුමක් ද?
   (1) නවසීලන්තය
   (2) ස්විඩනය
   (3) බ්‍රිතාන්‍ය
   (4) ශ්‍රී ලංකාව
   (5) ඉන්දියාව

11. එක්තරා උත්සවයකදී පිරිමින්ට හා ගැහැණුන්ට වෙන වෙනම ආරාධනා පත් යවනු ලදී. ආරාධනා පත් යැවූ ගැහැනුන්ගෙන් $1/3$ ද, පිරිමින්ගෙන් $1/4$ ද, උත්සවයට නොපැමිණි අතර 51 දෙනෙක් උත්සවයට පැමිණියහ. ගැහැණුන් හා පිරිමින් 73 කට ආරාධනා පත් යවන ලද්දේ නම්, පිරිමින් කී දෙනෙකුට ආරාධනා පත් යවන ලද්දේ ද?
   (1) 50
   (2) 45
   (3) 28
   (4) 44
   (5) 2

12. වැංකියක් පිරවීම සඳහා A නලයට පැය 3 ක් ගතවේ. එම වැංකියේ අඩක් පිරවීමට B නළයට පැය 2 ක් ගතවේ. A හා B යන නළ දෙකම එකවර ඇර තිබුණහොත් වැංකිය පිරවීමට කොපමණ වේලා ගතවනු ඇත් ද?

(1) පැය 1
(2) පැය 1 මිනිත්තු 30
(3) පැය 2
(4) පැය 1 මිනිත්තු 42
(5) පැය 1 මිනිත්තු 50

13. බෝට්ටුවක් මගින් ගඟකින් එතෙරවීමට සිටින මයින් 7 දෙනෙකුගේ බර 20kg, 30kg, 40kg, 60kg, 70kg, 80kg සහ 90kg වේ. බෝට්ටුව වරකට ගෙන යා හැකි උපරිම මඟී බර 100kg නම් සියලුම මඟීන් ගඟින් එතෙර කරවීමට බෝට්ටුව පැදවිය යුතු අවම වාර ගණන කියද?

(1) 6
(2) 5
(3) 4
(4) 3
(5) 2

14. මිනිසුන් දෙදෙනෙක් තම උපරිම සහ සාමාන්‍ය ධාරිතාවෙන් වැඩ කිරීමේදී සමාන කාර්යක්ෂමතාවක් පවයි. මෙම මිනිසුන් දෙදෙනා ඔවුන්ගේ උපරිම ධාරිතාවයෙන් වැඩ කලොත් කාර්යයක් නිම කිරීමට දින 3ක් ද සාමාන්‍ය ධාරිතාවයෙන් වැඩ කලොත් එම කාර්යය නිම කිරීමට දින 5ක් ද ගත කරනු ඇත. එක් මිනිසෙක් විසින් සිය උපරිම ධාරිතාවයෙන් දින 3ක් සිස්සේ මෙම කාර්යය සිදුකර පසුව තම සාමාන්‍ය ධාරිතාවයෙන් වැඩ කර කාර්යය අවසන් කරන ලදී. මෙම කාර්යය නිම කිරීමට ඔහුට ගතවූ සම්පූර්ණ කාලය කොපමණ ද?

(1) දින 6
(2) දින 7
(2) දින 6
(4) දින 9
(3) දින 10

15. බස් රථයක් A නැමති ස්ථානය $45kmh^{-1}$ ක වේගයෙන් පසු කරනු ලබයි. ඊට මද වේලාවකට පසු යතුරු පැදියක් $50kmh^{-1}$ ක වේගයෙන් බස් රථය පැමිණෙන දිශානතව B නැමති ස්ථානය පසු කරනු ලබයි. බස් රථය A ස්ථානය පසුකර විනාඩි 20 කට පසුව A හා B හි මධ්‍ය ස්ථානයේදී බස් රථය හා යතුරු පැදිය මුණ ගැසේ. යතුරු පැදිය B ස්ථානය පසු කරන්නේ, බස් රථය A ස්ථානය පසුකර විනාඩි කීයකට පසුව ද?

(1) විනාඩි 18
(2) විනාඩි 2
(3) විනාඩි 15
(4) විනාඩි 4
(5) විනාඩි 5

16. එක්තරා සංඛ්‍යාවක් එම සංඛ්‍යාවේ තුන් ගුණයට 24ක් අඩුය. එම සංඛ්‍යාව කවරේද?

(1) 11
(2) 24
(3) 36
(4) 15
(5) 12

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

17. පාරිභෝගිකයෙකු මිල දී ගන්නා ලී තොගයක් සඳහා 10% වට්ටමක් ලබා දේ. ලී වෙළෙඳසැලට ක්‍රෙඩිට කාඩ්පතකින් ගෙවන්නේ නම් යළිත් පාරිභෝගිකයාට 3% වට්ටමක් ලබා ගත හැකිය. රු. 30,000 මිල කළ ලී තොගය සඳහා ක්‍රෙඩිට කාඩ්පතින් ගෙවන පාරිභෝගිකයෙකුට ඒ සඳහා ගෙවිය යුතු මිල කොපමණ ද?

(1) රු. 26,190
(2) රු. 25,100
(3) රු. 28,000
(4) රු. 29,000
(5) රු. 26,000

18. ත්‍රිකෝණයක පැති තුනෙහි දිග 3 : 5 : 7 අනුපාතයට ඇත. එහි පරිමිතිය 30cm ක් වේ. එහි දිගින් වැඩිම පැත්තෙහි දිග සෙන්ටිමීටර කීයක් ද?.

(1) 6
(2) 8
(3) 10
(4) 14
(3) 16
(5) 14


19. වෘත්තයක අරය 10% කින් අඩුකළ විට එහි වර්ගඵලය කොපමණ ප්‍රතිශතයකින් අඩුවේද?

(1) 10%
(2) 19%
(3) 20%
(4) 36%
(5) 40%

20. පියදාස දැන් සිටිනවාට වඩා තවත් වසර 30 කින් හතර ගුණයකින් වියපත් වේ. පියදාසගේ දැන් වයස කීයද?

(1) වසර 34
(2) වසර 30
(3) වසර 26
(4) වසර 10
(5) වසර 32

21. රූප සටහනේ ඇති චතුරස්‍ර ගණන කීයද?




(1) 24
(2) 21
(3) 19
(4) 23
(5) 20

22. සුනිල්ගේ පියාගේ බිරිඳගේ මල්ලී කමල්ය. කමල් සුනිල්ගේ කවුද?

(1) මාමා
(2) බාප්පා
(3) පුංචි පියා
(4) මුණුපුරා
(5) අයියා

23. මෙම රූපයේ X කොටුව තුළ ඇතුළත් විය යුතු අංකය කුමක්ද?




(1) 10
(2) 11
(3) 8
(4) 20
(5) 19

24. පහත සඳහන් පූර්ණ සංඛ්‍යා සම්බන්ධයෙන් වඩාත් නිවැරදි කුමක්ද?

6, 7, 12, 13, 32

(1) මධ්‍යයනාය, මධ්‍යස්ථයට සමානය.
(2) මධ්‍යස්ථය, මධ්‍යයනයට වඩා 2කින් අඩුය.
(3) මධ්‍යස්ථය, මධ්‍යයනයට වඩා 2කින් වැඩිය.
(4) මධ්‍යයනාය, මධ්‍යස්ථයට වඩා 1කින් වැඩිය.
(5) මධ්‍යයනාය, මධ්‍යස්ථයට වඩා 1කින් අඩුය.

25. ෂානක, චානකට වඩා තුන් ගුණයක් වේගයෙන් දුවයි. චානක, ෂානකට වඩා 100m ඉදිරියෙන් ඉඳිමින් තරඟ දිවමක් ආරම්භ කරයි. ෂානක, චානක පසු කරන වෙලාවේදී චානක විසින් දුවන ලද දුර ප්‍රමාණය කොතරම් ද?

(1) 25m
(2) 50m
(3) 75m
(4) 100m
(5) 125m

26. ජදික වේදිකාවක් දිගේ ඇවිද යන මිනිසෙකු මීටර 125 ක් උතුරු දිශාවට ගමන්කර දකුණට හැරී මීටර 100 ක් ගමන් කළ පසු නැවත දකුණට හැරී තවත් මීටර 200 ක් ගමන් කරයි. දැන් ඔහු නැවත වමට හැරී මීටර 300 ක් ගමන් කරයි. දැන් ඔහු ගමන් කරමින් සිටින්නේ කවර දිශාවකට ද?

(1) උතුරට
(2) දකුණට
(3) වයඹට
(4) නැගෙනහිරට
(5) බටහිරට

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved




27. අංක 1 මුහුණතට සම්මුඛ (විරුද්ධ පැත්තේ ඇති) මුහුණතේ ඇති අංකය කුමක්ද?

(1) 1 (2) 2
(3) 3 (4) 4
(5) 5

28. අංක 2 මුහුණතට සම්මුඛ මුහුණතේ ඇති අංකය කුමක්ද?

(1) 1 (2) 3
(3) 6 (4) 4
(5) 5


29. අංක 3 මුහුණතට සම්මුඛ මුහුණතේ ඇති අංකය කුමක්ද?

(1) 4 (2) 5
(3) 1 (4) 2
(5) 6

30. ඔරලෝසුවක් උදේ 6 වැදීමට 6 වරක් නාද වේ. ඒ සඳහා තත්පර 6 ක කාලයක් ගත වේ නම් දවල් 11 වැදීමට ගතවන කාලය කොපමණ ද?

(1) 10 (2) 6
(3) 9 (4) 12
(5) 11

31.




*A* සොයන්න.

(1) 301 (2) 308
(3) 321 (4) 348
(5) 356

32. උසස් පෙළ පන්තියක කිසිම ගැහැණු ළමයෙක් ගණිතය හදාරනු නොලැබේ. භෞතික විද්‍යාව හදාරන ඇතැම් ළමයි ජීව විද්‍යාව හැදෑරුවත්, ජීව විද්‍යාව හදාරන කිසිවෙක් ගණිතය හදාරනු නොලැබේ. ගණිතය හැර අනෙක් විෂයන් ගැහැණු පිරිමි දෙවර්ගයම හදාරනු ලැබේ. ඒ අනුව,

(1) ජීව විද්‍යාව නොහදාරන සෑම දෙනාම ගණිතය හෝ භෞතික විද්‍යාව හදාරයි


(2) ගණිතය නොහදාරන සමහරු ජීව විද්‍යාව හා භෞතික විද්‍යාව හදාරයි


(3) සියලුම ළමයින් භෞතික විද්‍යාව හෝ ගණිතය හදාරයි


(4) ජීව විද්‍යාව හා භෞතික විද්‍යාව යන විෂය දෙකම නොහදාරන සෑම ළමයෙක්ම ගණිතය හදාරයි


(5) ජීව විද්‍යාව නොහදාරන සියලුම පිරිමි ළමයි ගණිතය හදාරයි


33. නොගැලපෙන රූපයට හිමි අංකය කුමක්ද?


(1)


(2)


(3)


(4)


(5)

- ලසිතා, හිරානි, වයංගා, අමන්දි, මීනා, අචලා සහ මදූරි යන නම්වලින් යුත් මිතුරියන් සත් දෙනෙකු මේසයක් වටා හිඳගෙන පාඩම් කරමින් සිටී.
  - අචලා වාඩිවී සිටින්නේ, මදූරිට දකුණෙන් දෙවනියාවය.
  - හිරානි, අචලා ලඟින් හැර වයංගා ලඟින් වාඩිවී නොමැත.
  - වයංගා ලඟින් වාඩිවී සිටින මීනා සිටිනුයේ මදූරියේ දකුණු පසින් තුන් වෙනියාවය.
  - අමන්දි වාඩිවී සිටින්නේ ලසිතා හා වයංගා අතරය.

34. ලසිතාගේ දකුණු පසින් වාඩිවී සිටින්නේ කවුද?

(1) අමන්දි (2) හිරානි

(3) මදූරි (4) වයංගා

(5) මීනා

35. මීනාගේ දකුණු පසින් තුන්වෙනියාට වාඩිවී සිටින්නේ කවුද?

(1) ලසිතා (2) මදූරි

(3) වයංගා (4) අචලා

(5) හිරානි

36. හිරානි දෙපසින් වාඩිවී සිටින්නේ කවුද?


(1) මීනා සහ අචලා (2) වයංගා සහ අමන්දි

(3) මදූරි සහ අමන්දි (4) අචලා සහ මදූරි

(5) මීනා සහ අමන්දි

සියලුම හිමිකම් ඇවිරිණි / *All Rights Reserved*


37. A හා B නමැති පා පැදි කරුවන් දෙදෙනෙක් එකම වෙලාවට තම පා පැදි පදවන්නට පටන් ගත්හ. ඔවුන් දෙදෙනාගේම ආරම්භක වේගය වැඩි වීමේ ශීඝ්‍රතාවයට වඩා වැඩි යීඝ්‍රතාවයකින්, තම වේගය ක්‍රමයෙන් වැඩි කලේය. එහෙත් ටික වේලාවකට පසු A වේගය අඩු කළ අතර B තම වේගය ක්‍රමයෙන් වැඩි කිරීමට පටන් ගත්තේය. දෙදෙනාගේ වේගය සම වූ විට A තම වේගය නැවතත් කලින් ඔහු එළඹ තිබූ වේගයට සමාන වන තුරු වැඩිකරන්නට පටන් ගත් අතර B තම වේගය ක්‍රමයෙන් අඩු කරන්නට පටන් ගත්තේය.
මේ පාපැදි කරුවන් දෙදෙනාගේ චලිතය නිවැරදිව දක්වෙන්නේ මින් කවර රූප සටහනේ ද?




38. අධික අවුරුද්දක් විය නොහැකි වර්ෂය තෝරන්න.

(1) ක්‍රි. ව 2000
(2) ක්‍රි. ව 2400
(3) ක්‍රි. ව 2800
(4) ක්‍රි. ව 2100
(5) ක්‍රි. ව 1600


39. එක්තරා අයුරකින්  රූපය  රූපයට සම්බන්ධ වෙයි. පහත දැක්වෙන රූපවලින් කුමක් ඒ අයුරින්  රූපයට සම්බන්ධ වෙයි ද?



(1) (2) (3) (4) (5)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights Reserved

40.




ඉහත සඳහන් ප්‍රස්තාරයෙන් දක්වෙන්නේ පහත සඳහන් ප්‍රකාශයන්ගෙන් කුමන කරුණ ද?

(1) සිරස් අක්ෂය හා තිරස් අක්ෂයේ විචල්‍යන් අතර අනුලෝම සම්බන්ධතාවයකි.

(2) සිරස් අක්ෂය හා තිරස් අක්ෂය අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයකි.

(3) X හා Y අක්ෂ අතර සෘණ සහසම්බන්ධතාවයකි.

(4) X හා Y අක්ෂයේ විචල්‍යන් අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයකි.

(5) සිරස් අක්ෂයට හෝ තිරස් අක්ෂයට විචල්‍යයේ කිසිදු සම්බන්ධතාවයක් නැත.

41. කල දර්පණයකින් දක්වෙන පරිදි ඔරලෝසුවක වේලාව (කටු පිහිටන ආකාරය අනුව) 3.35 නම් එවිට සත්‍ය වේලාව කීය ද?

(1) 8.25 (2) 9.45

(2) 6.25 (4) 4.35

(3) 2.45

42. 100 : 150 අනුපාතයට සමාන අනුපාතය වනුයේ,

(1) 10 : 30 (2) 80 : 240

(3) 2 : 3 (4) 25 : 75

(5) 15 : 10

43. මගේ ඔරලෝසුවේ වේලාව 12.25 ලෙස සටහන් වී ඇති විට නිමල්ගේ ඔරලෝසුවේ සටහන් වී ඇති වේලාව 12.10 වේ. එම අවස්ථාවේ ගුවන්විදුලි යන්ත්‍රයෙන් එම වේලාව ප්‍රකාශිත වූයේ 12.30 ලෙසටය. නගර මධ්‍යයේ ඇති ඔරලෝසු කණුවේ එම වේලාව සටහන් වූයේ 12.15 ලෙසටය. රූපවාහිනී තිරයේ සටහන් වූ වේලාව 12.20 වූ අතර එම වේලාව නිවැරදි වේලාව ලෙස සලකන්නේ නම් ඔරලෝසුවල වේලාවන් අඩුවෙන් හෝ වැඩියෙන් හෝ යන කාලයේ සාමාන්‍යය කවරේද?

(1) විනාඩි 3ක් වැඩියෙන් (2) විනාඩි 3ක් අඩුවෙන්

(3) විනාඩි 4ක් වැඩියෙන් (4) විනාඩි 4ක් අඩුවෙන්

(5) විනාඩි 6ක් අඩුවෙන්

44. එක්තරා ඇඟලුම් කම්හලක නිෂ්පාදනය සතියකට 4% කින් වැඩි කිරීමට ඉලක්ක කර ගනිමින් ඒ සඳහා සේවකයන්ට සතියකට දීන ගික වැඩ මුරයක් බැගින් ඇති කරන ලදි. නිෂ්පාදනය 4% කින් වැඩි කිරීමට එය ප්‍රමාණවත් නොවූ බැවින් වැඩ කිරීමේ දින ගණන වැඩි කළ යුතු ප්‍රතිශතය කුමක් විය යුතුද?

(1) 2%
(2) 3%
(3) 4%
(4) 5%
(5) 6%

45. පහත ප්‍රශ්න දෙක පදනම් වන්නේ පහත දක්වෙන තොරතුරු මතය එක් එක් ප්‍රශ්නයේ යෝජනාවක් සහ මත දෙකක් ඉදිරිපත් කොට තිබේ. එක් එක් යෝජනා සම්බන්ධයෙන්.

අංක I මතය පමණක් යෝජනාව තහවුරු කරන්නේ නම් A ද,

අංක II මතය පමණක් යෝජනාව තහවුරු කරන්නේ නම් B ද,

අංක I සහ II යන මත දෙක එකට සම්බන්ධ කරගත් විට යෝජනාව තහවුරු කරන්නේ නම් D ද,

අංක I සහ II යන මත දෙකින් එකක්වත් යෝජනාව තහවුරු නොකරන්නේ නම් E ද, ලෙස දක්වෙන අංකය තෝරන්න.

යෝජනාව : සුරාසැල් සම්පූර්ණයෙන්ම වසා දැමිය යුතුය.

I මතය : ඒ මගින් මත්පැන් භාවිත කරන්නා පිරිහීමට පත් වේ.

II මතය : සුරාවෙන් ජන සමාජයට ද අහිතක් සිදු වේ.

(1) A
(2) B
(3) C
(4) D
(5) E

46. ඡේදයේ දක්වෙන අදහස ඉතා මැනවින් සාරාංශ කොට ඇති ප්‍රකාශය තෝරන්න.

කාර්මීකරණය සමඟ කර්මාන්ත බිහිවී ලෝකයේ බොහෝ රටවල් ඒ තුළින් දියුණුවනු දැකිය හැකිය. එහෙත් මෙම කම්හල්වලින් පිටවන වායූන්ගෙන් සිදුවන විනාශය පිළිබඳ එතරම් අවධානය යොමුවුණේ නැත. කර්මාන්තශාලාවලින් පිටවන දුමෙහි අන්තර්ගත වායු වර්ග ඉන්පසු වායුගෝලයේ ඇති ජලයේ දියවී අම්ල බවට පත්වේ. නයිට්‍රජන් හා සල්ෆර් අඩංගු වායු වර්ගවලින් නයිට්‍රික්, සල්ෆියුරික් අම්ල ඇති වේ. මේ අම්ල වර්ෂා ජලය සමඟ පොළවට පතිත වේ. ඉන් සිදුවන විනාශය මහත්ය.

(1) කාර්මීකරණය නිසා ලෝකයට සිදුවූයේ හානියකි.
(2) කම්හල්වලින් පිටවන දුම් මගින් වැසි ජලය දූෂණය වේ.
(3) කාර්මීකරණයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල් දියුණු තත්වයට පත්වේ.
(4) කර්මාන්තවලින් පිටවන දුම්වලින් කිසිදු හානියක් සිදු නොවේ.
(5) සෑම කර්මාන්තශාලාවකම යන්ත්‍ර සූත්‍ර යම් ප්‍රමිතියකට අනුව පවත්වාගෙන යයි.

47. නිමල්, අමල් හා කමල් බංකුවක් මත වාඩි වී දර්පණයක් දෙස බලා සිටී, නිමල්ට දකුණින් කමල් ද වමින් අමල් ද වාඩි වී සිටින අතර නිමල් හා කමල් තමන් වාඩි වී සිටින ස්ථාන මාරු කර ගත්තේ නම් දර්පණ ප්‍රතිබිම්බයක් සේ දක්වෙන පරිදි නිමල්ට දකුණින් සිටින්නේ කවුද?

(1) නිමල්
(2) අමල්
(3) කමල්
(4) අමල් හා කමල්
(5) නිමල් හෝ කමල්

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

48. මාසිකව 12% සුළු පොලියට මාස්පතා රු.50/= බැගින් ඒ ඒ මාසයේ භාවිතා වූ මුදලට පොලියක් සමග ගෙවීමට රු.400/= ක් ණයට ගත් කෙනෙක් ණය මුදල ගෙවා අවසන් වන විට, පොලි වශයෙන් පමණක් කීයක් ගෙවිය යුතු ද?

(1) 250/= (2) 216/=
(3) 300/= (4) 370/=
(5) 220/=

49. විනාඩි 50 කදී සැතපුම් 10 ක් දුර ගිය ළමයෙක් ගමනේ දුරෙන් පළමු අර්ධය පැ. සැ. 10 ක වේගයෙන් යන ලදී. කාලයෙන් ප්‍රථම දෙකෙන් පංගුව පැ. සැ. 10 බැගින් යන ලද්දේ නම් ඉතිරි කොටස ගියේ කවර වේගයකින් ද?

(1) පැ. සැ. 16 (2) පැ. සැ. 10
(3) පැ. සැ. 14 (4) පැ. සැ. 12
(5) පැ. සැ. 15

50. පහත දක්වෙන ගැටලුවේ සරල සිද්ධියක් හා සම්බන්ධ අවස්ථා 8ක් A – H තෙක් පින්තූර මගින් දක්වා තිබේ. එම පින්තූර දක්වා ඇත්තේ අවස්ථාවල අනුපිළිවෙලින් නොවේ. පහත දක්වෙන පිළිතුරු අතරින් එකක් පමණක් අවස්ථා 4ක් අනුපිළිවෙලින් දක්වයි. එම පිළිතුර කුමක් ද? ඔබගේ පහසුව සඳහා එම සිද්ධිය පිළිබඳ කෙටි විස්තරයක් පින්තූර සමග දක්වා තිබේ.

❖ මාළු බෑම සඳහා ගිය පුද්ගලයෙකු අල්ලන ලද සියලුම මාළු බළලකු විසින් කා දමන ලද නිසා දුකට පත්වෙයි.

(1) E B C H (2) D B H G
(3) C E A F (4) D B F G
(5) B D E G

